2024.09.02

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## නාට්‍ය හා රංග කලාව

විභාග අංකය: .................................

| 06 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

### I කොටස

❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් (√) ලකුණු ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

01. ජනකතා කියවීම තුළින් අපගේ කතා විලාසය හා භාෂාව දියුණුකර ගත හැකි ය. ( )

02. 'අනුන්ට කැපූ වළේ තමන් වැටීම' යනු ජාතක කතාව කි. ( )

03. රංග අභ්‍යාසවල යෙදීම අවශ්‍ය වන්නේ නාට්‍ය අධ්‍යක්ෂවරයාට ය. ( )

04. කඩදාසි පිටුවකින් සාදන නව නිර්මාණයකට පරිකල්පනය උපයෝගී වේ. ( )

05. සිරිත් මල්දම යනු උපදේශාත්මක සාහිත්‍යයට අයත් ග්‍රන්ථය කි. ( )

❖ A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| 06. | හෝඩියේ ස්වර අකුරු එක් එක් අයුරින් කියවීම | වැස්ස |
| 07. | විවිධ භූමිකා සාර්ථක කර ගැනීමට | නාට්‍යෝපකරණ |
| 08. | ස්වාභාවික පරිසරය | නරි බැණා නාට්‍යය |
| 09. | වෙද නළාව සහ සිරිංජය | හඬ අභ්‍යාස |
| 10. | ඇහැල මලින් ගස් පිරිලා .... | සමාරෝපය |

❖ ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

11. නාට්‍යෝපකරණ අයත් වන්නේ .................................. අභිනයට ය.

12. නාට්‍යයක් නැරඹීම සඳහා පැමිණ සිටින තැනැත්තා ......................... නම් වේ.

13. නළුවාගේ ශරීරය ............................. අභිනය සඳහා ප්‍රබලව යොදා ගැනේ.

14. ...................................... මුල, මැද, අග සහිතව ඉදිරිපත් කරයි.

15. එක් චරිතයක් තුළ විවිධ .................................. රසක් දැකගත හැකි ය.

(ආංගික / ආහාර්ය / භූමිකා / ප්‍රේක්ෂකයා / ජන් කතා)

❖ අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

16. කතාන්දර අසා සිටින්නා මෙම නමින් හඳුන්වයි.

(1) පාඨකයා (2) රසිකයා
(3) ප්‍රේක්ෂකයා. (4) ශ්‍රාවකයා

17. ආනුෂංගික කලාව කි.

(1) නළු නිළියන් (2) වේෂ භූෂණ
(3) නාට්‍ය පෙළ (4) රංග භූමිය

18. සත්ත්ව චරිතයක් අනුකරණය කිරීමේදී නළුවා විසින් එතරම් සැලකිල්ලට නොගත යුත්තේ,

(1) සතාගේ ප්‍රමාණයයි. (2) සතාගේ හැසිරීමයි.
(3) සතාගේ අලංකාරයයි. (4) සතාගේ හඬයි.

19. පෙර පුහුණුවකින් තොරව ඉදිරිපත් කරනු ලබන්නේ,

(1) ක්ෂණික නිරූපණ වේ. (2) භූමිකා රංගන වේ.
(3) නාට්‍ය ගීත ගායනය වේ. (4) රංග විධාන වේ.

20. මෙම රූපයෙන් නිරූපණය වන හැඟීම කුමක් ද?

(1) ප්‍රීතිය (2) භය
(3) ශෝකය (4) කෝපය



(ලකුණු 1x20 = 20)

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
- ❖ ඉතිරි ප්‍රශ්න අතුරෙන් දෙකක් තෝරාගෙන සම්පූර්ණ ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(01). පහත දැක්වෙන්නේ එක්තරා ජන කතාවකට අයත් පදා කොටසකි. ඒ අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මල්ලියෙ ඔහොම නොකරන් අපෙ අම්මාට
දෙතනේ කිරි දුන්නෙත් අපි දෙන්නාට
.............................................................
.............................................................

i. මෙහි ඉතිරි පාද දෙක සම්පූර්ණ කරන්න. (ල.02)

ii. ඉහත පදා කොටස අයත් ජන කතාවේ නම කුමක් ද? (ල.02)

iii. එම ජන කතාවේ අඩංගු චරිත මොනවා ද? (ල.02)

iv ඉහත අවවාද ලබා දෙන චරිතයේ ඔබ දකින යහපත් ලක්ෂණයක් හා වරද කරන ලද චරිතයේ අයහපත් ලක්ෂණයක් සඳහන් කරන්න. (ල.02)

v ඔබ ඔබේ අම්මා පිළිබඳව පේළි හතරක කවියක් නිර්මාණය කරන්න. (ල.02)

(02). i. කටහඬ මගින් අදහස් ප්‍රකාශ කිරීම අයත්වන අභිනය කුමක් ද? (ල.02)

ii. කටහඬ ප්‍රයෝජනයට ගන්නා කලා මාධ්‍ය තුනක් ලියන්න. (ල.03)

iii. විවිධ කටහඬ පරාසයන් පුහුණු කිරීමෙන් නළුවෙකුට ලැබෙන වාසි මොනවාදැයි විස්තර කරන්න. (ල.05)

(03). i. අනුකරණය යනු කුමක් ද? (ල.02)

ii. ඔබට අනුකරණය කළ හැකි පුද්ගල චරිතයක් නම් කර එහි බාහිර ලක්ෂණ තුනක් ලියන්න. (ල.03)

iii. බස් කොන්දොස්තරවරයෙකු හා මගියෙකු අතර ඇතිවන්නා වූ කෙටි සංවාදයක් රචනා කරන්න. (ල.05)

(04). i. නාට්‍යයක් යනු කුමක් ද? (ල.02)

ii. නාට්‍යයක් සහ කතාන්දරයක් අතර ඇති වෙනස්කම් තුනක් ලියන්න. (ල.03)

iii. ඔබ දන්නා කතාන්දරයක් හා එහි එන චරිතයක් නම් කර එයට සුදුසු ඇඳුමක් සහ රංග භාණ්ඩයක් ඇඳ නම් කරන්න (රූපය සඳහා සම්පූර්ණ පිටුවක් භාවිත කරන්න). (ල.05)

(05). i. මානුෂ සහ අධිමානුෂ චරිත යනු මොනවා ද? (ල.02)

ii. අධි මානුෂ චරිත තුනක් නම් කරන්න. (ල.03)

iii. ඔබ දන්නා සත්ත්ව චරිත සහ අධි මානුෂ චරිත අයත් වන කතාන්දරයක් ලියන්න. (ල.05)

(ලකුණු 10 x 3 = 30)



REGISTRAR
De Mazenod College
Kandana